**<u>අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, බස්නාහිර පළාත</u>**

**<u>පාරම්පරික චිත්‍ර / මූර්ති පාඨමාලාව සඳහා සම්පත්දායකයින් බඳවා ගැනීම - 2023</u>**

අප අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන හොරණ කලාකෙත සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්වීමට නියමිත පාරම්පරික චිත්‍ර/මූර්ති පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු සඳහා පහත සුදුසුකම්ලත් සම්පත්දායකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>**

1. පිළිගත් විශ්වවිද්‍යාලයක / ආයතනයක චිත්‍ර හා මූර්ති උපාධියක්, ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

   හෝ

2. රජයේ පාරම්පරික චිත්‍ර / මූර්ති ශිල්පී අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමාධාරියෙකු වීම.
3. චිත්‍ර හා මූර්ති ශිල්පියෙකු වශයෙන් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**<u>පාඨමාලා පිළිබඳ විස්තර</u>**

තුන් අවුරුදු පාඨමාලාවක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන මෙම පාඨමාලාව සතියේ දින පහේ පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පවත්වනු ලැබේ.

**<u>විෂයය අන්තර්ගතය</u>**

1. පාරම්පරික චිත්‍ර
2. පාරම්පරික සැරසිලි මෝස්තර
3. ජීව රූප ඇඳීම අධ්‍යයනය හා වර්ණ කිරීම
4. පරිසරය චිත්‍රණය කිරීම
5. ජීව අජීව ද්‍රව්‍ය බලා ඇඳීම හා අධ්‍යයනය
6. මූර්ති ශිල්පය
7. ග්‍රැෆික් නිර්මාණ හා කලා නිර්මාණ සැකසීම
8. කලා ඉතිහාසය, රසාස්වාදය හා ඉගැන්වීමේ ක්‍රම සහ මූලධර්ම අධ්‍යයනය
9. පාරම්පරික චිත්‍ර පිටපත් කිරීම හා සංරක්ෂණය
10. විහාර චිත්‍ර ඇඳීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඔබගේ ජීව දත්ත තොරතුරු සහ සුදුසුකම් සහිත අයදුම්පත්‍රය 2023.03.22 වන දිනට පෙර <u>බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, 2 වන මහළ, අංක 204, නව පළාත් සභා ගොඩනැගිල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල</u> ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. **<u>අයදුම්පත් යොමු කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පාරම්පරික චිත්‍ර/මූර්ති පාඨමාලාව සඳහා සම්පත්දායකයින් බඳවා ගැනීම යනුවෙන් සඳහන් කළ යුතුය.</u>**

වැඩිදුර විමසීම් : සංස්කෘතික නිලධාරී, අයේෂා කරුණාසේන මිය - 071-9694944
පාරම්පරික චිත්‍ර/මූර්ති ශිල්පීන්ගේ ආයතනය, අයි.ජී. චන්ද්‍රිකා මිය - 071-6358016

**සිරිසෝම ලොකුවිතාන**
ලේකම්
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත.